**අධ්‍යාපන අමාත්‍යාංශය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය, 2018 දෙසැම්බර්**

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**බුද්ධ ධර්මය i,ii** | **කාලය පැය තුනයි**

## බුද්ධ ධර්මය i

**සැලකිය යුතු යි**

(1) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(2) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(3) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක්එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සසැඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

(4) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. ඇතැම් වස්කාලයන්හි ප්‍රමාණවත් පරිදි සිව්පසය නොලැබුණ ද, එයට බුදුරජාණන් වහන්සේ අභියෝගාත්මක ව මුහුණ දුන්සේක. එසේ සිව්පසය නොලැබුණ වස්කාලයක් වන්නේ,
   1. කොසැඹෑනුවර වස්විසූ වකවානුව යි.
   2. විශාලාමහනුවර වස්විසූ වකවානුව යි.
   3. පාරිලෙය්‍යවනයේ වස්විසූ වකවානුව යි.
   4. වේරංජාවේ වස්විසූ වකවානුව යි.

02. "බඹරා මල නොතලා රොන්ගන්නා පරිද්දෙන්" භික්ෂුව ක්‍රියා කළයුතු යැ යි, බුදුරජාණන් වහන්සේ උපදෙස් ලබා දී ඇත්තේ,
   1. ප්‍රත්‍ය පහසුකම් ලබාගැනීම සම්බන්ධයෙනි.
   2. ධර්මය ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙනි.
   3. භික්ෂු ගැටුම් දුරු කර ගැනීම සම්බන්ධයෙනි.
   4. ගිහියන් පැවිද්දට යොමුකර ගැනීම සම්බන්ධයෙනි.

03. නිවන් පසක් කරගැනීමට අවශ්‍යවන්නා වූ පිළිවෙත් රකින බැවින් මහා සංඝරත්නය,
   1. සුපටිපන්න නම් වේ.
   2. ඤාය පටිපන්න නම් වේ.
   3. උජු පටිපන්න නම් වේ.
   4. සාමීචි පටිපන්න නම් වේ.

04. පඤ්ච නීවරණ වලට අයත් **ථිනමිද්ධය** උපමාකර ඇත්තේ.
   1. කැළඹුණු ජලයට ය.
   2. පාසි සහිත ජලයට ය.
   3. බොර ජලයට ය .
   4. රත් වී උතුරන ජලයට ය.

05. "ගෞතමයන් වහන්ස ඇතුළත අවුල් ය. පිටත ද අවුල් ය. සත්ත්ව ප්‍රජාව අවුලෙන් වෙලී සිටියි. කවරෙක් නම් නිරවුල් කරන්නේ ද?" මේ ප්‍රකාශය කරනු ලැබුවේ,
   1. දෙවියෙක් විසින් ය.
   2. කොසොල් රජු විසින් ය.
   3. සුභ මානවකවිසින් ය.
   4. කාලාමවරුන් විසින් ය.

06. අෂ්ට සමාපත්ති උපදවාගත් තවුසෙකු වන්නේ,
   1. ආලාර කාලාම තවුසාණන් ය.
   2. කොණ්ඩඤ්ඤ තවුසාණන් ය.
   3. භාර්ගව තවුසාණන් ය.
   4. උද්දකරාම පුත්ත තවුසාණන් ය.

07. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ ශාසනික සේවා ලැයිස්තුවට ඇතුළත් **නොවන්නේ,**

1. උඩුනුවර නියම කන්දේ පිරිවෙනක් පිහිටුවීම යි.
2. අනුරාධපුර, පොළොන්නරුව, දඹුල්ල යන බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම යි.
3. පරම විඥානාර්ථ සමාගම පිහිටුවා බෞද්ධ පාසල් ආරම්භ කිරීම යි.
4. මහනුවර දේවාල පෙරහැරට දළදා මාළිගාවේ මහ පෙරහැර එක්කිරීම යි .

08. බුදුරජාණන්වහන්සේ විසින් දේශනා කර ඇති පරිදි ස්කන්ධ ධර්මයන් පහකි. එහි සංඛාර ස්කන්ධය ලෙස හැඳින්වෙන්නේ,

1. සිත්වල උපදින නිමිති හා සටහන් ය.
2. සුඛ දුක්ඛ ආදී වින්දනයන් ය.
3. ප්‍රබල චේතනා, රැස්කිරීම් ය.
4. රූපාදී අරමුණු දැනගනීම් ය.

09. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි භාර්යාවගෙන් ස්වාමියාට ඉටුවිය යුතු යුතුකම්වලට අයත් කරුණකි,

1. අවශ්‍ය කටයුතු ඉටුකර දීම.
2. සෑම කටයුත්තකදී ම දක්ෂවීම හා අනලස්වීම.
3. අවශ්‍ය උපස්ථාන කිරීම.
4. සුදුසු කල්හි සම්පත් පවරාදීම.

10. පද්ම උපමාවට අනුව මඩ ජලය හා සම ව සිටින නෙළුම් පොහොට්ටුවලට සමාන කර ඇත්තේ,

1. උත්තම පෞරුෂ ඇත්තෝ ය.
2. අව ම පෞරුෂ ඇත්තෝ ය.
3. මධ්‍යම පෞරුෂ ඇත්තෝ ය .
4. දීන පෞරුෂ ඇත්තෝ ය.

11. තමා උපමා කොට අනුන් හට වැරදි නොකළ යුතු යැ යි බුදුදහමේ සඳහන් වෙයි. එසේ තමා උපමා කොට වරදින් වැළකීමේ ක්‍රමය,

1. හේතුඵල ධර්මය යි.
2. ලෝකාධිපතෙය්‍ය ධර්ම යි.
3. ධම්මාධිපතෙය්‍ය ධර්මය යි .
4. අත්තූපනායික ධර්මය යි.

12. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් පරිදි උට්ඨාන සම්පදාව යන්නෙන් අර්ථවත් වන්නේ,

1. දැහැමින් ධනය ඉපැයීම යි.
2. දැහැමින් ධනය පරිහරණය කිරීම යි.
3. දැහැමින් ධනය විය පැහැදම් කිරීම යි.
4. දැහැමින් ධනය බෙදා හදා දීම යි.

13. පස්කම් සැපතින් නික්මීම, අනුන්ට හිංසා කිරීමෙන් වැළකීම, අනුන් නොනැසීමේ චේතනාව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ,

1. සම්මා සංකප්පයට අයත් වේ.
2. සම්මා වායාමට අයත් වේ.
3. සම්මා කම්මන්තයට අයත් වේ.
4. සම්මා ආජීවයට අයත් වේ.

14. දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව යන ගුණ ධර්ම සඳහා භාවිත ශාසනික වචනය වන්නේ,

1. සිව් බඹවිහරණ ය.
2. සිව්සස් ය.
3. සතර අගති ය.
4. සිව් සඟරාවත් ය.

15. බුදු දහමෙහි ජනක කර්මය නමින් විස්තර වන්නේ,

1. මරණින් මතු ඊළඟ භවයේ උපත ලබාදීමට ඉවහල් වන කර්ම ශක්තිය යි..
2. සත්වයාගේ උපන් කර්ම ශක්තිය පවත්වාගෙන යාමට උදව් දෙන කර්ම ශක්තිය යි.
3. මෙලොවදීම විපාක දෙන කර්ම ශක්තිය යි .
4. දෙවන භවයේ විපාක දෙන කර්ම ශක්තිය යි.

16. අනිත්‍ය දේ අනිත්‍ය ලෙස ත්, දුක් සහිත දේ දුක් ලෙස ත්, අනාත්ම දේ අනාත්ම ලෙස ත්, අසුබ දේ අසුබ ලෙස ත්,දක්නා තැනැත්තාගේ ජීවන චර්යාවට අයත් **නොවන්නේ,**

1. අකම්පිත බව ය.
2. අල්පේච්ඡබවය.
3. අතෘප්තිකර බව ය.
4. අනතිමානි බව ය.

17. මාර්ගාංග වශයෙන් අටකින්ද, ශික්ෂා වශයෙන් තුනකින් ද, යුක්ත වන බැවින් දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව

1. මධ්‍යම ප්‍රතිපදාව වේ.
2. පුනර්භවය වේ.
3. පටිච්ච සමුප්පාදය වේ.
4. ත්‍රිලක්ෂණය වේ.

18. බුදුරජාණන් වහන්සේ අජාසත්ත මහරජතුමාට සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කරනු ලැබුවේ.
   1. ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනෙහි දී ය.
   2. ඉසිපතනයේ මිගදායේ දී ය.
   3. ජීවක අඹ උයනේ දී ය.
   4. ජේතවනාරාමයේ දී ය.

19. "මෙම භූමිභාගය ඉතා රමණීය යි. වන ලැහැබ ඉතා ප්‍රසාද ජනක යි. නානතොට ඇති සුදුවැලිතලා මැදින් ගලන නදිය ද සිත් සනසවන සුළු වෙයි". බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්ය මේ ආකාරයට ඇගයීමට ලක්කර ඇත්තේ,
   1. අරියපරියේසන සූත්‍රයේ දී ය.
   2. සිංසපා සූත්‍රයේදී ය.
   3. සාමඤ්ඤඵල සූත්‍රයේදී ය
   4. මහාසීහනාද සූත්‍රයේ දී ය.

20. ලොව බලවත් ම රෝගය ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනු ලැබුවේ,
   1. මානසික රෝග යි.
   2. කායික රෝග යි.
   3. ඊර්ෂ්‍යාව යි.
   4. කුසගින්න යි.

21. ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි භික්ෂූන් වහන්සේලාගේ නිරෝගීතාව සඳහා බුදුරජාණන් වහන්සේ අනුමත කරනු ලැබුවේ,
   1. ආගන්තුක වත යි.
   2. සක්මන් මළුව යි.
   3. භාවනාව යි.
   4. කැඳපානය යි.

22. ථේරවාදී භික්ෂූන් වහන්සේලාගේ අදහසට අනුව බුද්ධ ශාසනයේ ආයුෂය ලෙස සළකනු ලැබුවේ,
   1. විනය යි.
   2. ධර්මය යි.
   3. අභිධර්මය යි.
   4. සූත්‍ර ධර්ම යි.

23. පුස්ථකාරූඪ සංගීතිය ලෙස හැඳින්වනුයේ,
   1. පළමු ධර්ම සංගායනාව යි.
   2. අළුවිහාර ධර්ම සංගායනාව යි.
   3. තෙවන ධර්ම සංගායනාව යි.
   4. දෙවන ධර්ම සංගායනාව යි.

24. පොළොන්නරු යුගයට අයත් ඉපැරණි බෞද්ධ සිතුවම් දැකිය හැකි ස්ථානයක් වන්නේ,
   1. හිඳගල යි.
   2. සීගිරිය යි.
   3. රිදීවිහාරය යි.
   4. තිවංක පිළිමගෙය යි.

25. කුස ජාතකය පදනම් කරගෙන දඹදෙණි සාහිත්‍යය යුගයේ දී රචනා වූ පද්‍ය සාහිත්‍ය කෘතියක් වනුයේ,
   1. පූජාවලිය යි.
   2. කව්සිළුමිණ යි.
   3. සද්ධර්මරත්නාවලිය යි.
   4. බුදුගුණ අලංකාරය යි.

26. රාජ්‍ය පාලනයට අදාළ දස සක්විතිවත් දක්වෙනුයේ,
   1. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.
   2. කූටදන්ත සූත්‍රයේ ය.
   3. වාසෙට්ඨ සූත්‍රයේ ය.
   4. අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

27. බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය හෙවත් බාහිර පෞරුෂය කෙරෙහි ප්‍රසාදයෙන් පැවිදි වූ හිමිනමක් වූයේ,
   1. අස්සජි තෙරුන් වහන්සේ ය.
   2. ආනන්ද තෙරුන් වහන්සේ ය.
   3. සැරියුත් තෙරුන් වහන්සේ ය.
   4. වක්කලී තෙරුන් වහන්සේ ය.

28. බුදුරජාණන් වහන්සේ විසින් ගැරඬියෙකුට හිංසා කරන දරුවන් පිරිසකට එම ක්‍රියාවේ ඇති අනිසි ඵල විපාක පෙන්වා දී එම සතා බේරා ගැනීම
   1. පුරිසදම්මසාරථී ගුණය යි.
   2. අසරණ සරණ ගුණය යි.
   3. තාදී ගුණය යි.
   4. ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය යි.

29. බෝසතාණන් වහන්සේ **නෙක්ඛම්ම පාරමිතාව** පූරණය කළ ආකාරය විවරණය කෙරෙන ජාතක කතාවක් නම්,
   1. වෙස්සන්තර ජාතකය යි.
   2. මඛාදේව ජාතකය යි.
   3. සිවි ජාතකය යි.
   4. සස ජාතකය යි.

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම අධ්‍යාපන ඒකකය

30. "තමාගේ අභිවෘද්ධිය ගැන සිතා හෝ අනුන්ගේ අභිවෘද්ධිය ගැන සිතා හෝ තම අඹු දරුවන්ගේ අභිවෘද්ධිය ගැන සිතා හෝ ධනය ඉපැයීම නොකළ යුතු බව දක්වෙන "ගාථාවේ මුල් දෙපදය වන්නේ,
1. ''දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං ......'' යන්න යි.
2. ''නතං කම්මං කතං සාධූ - යං කත්වා අනුතප්පති ......'' යන්න යි.
3. ''යෝ චේ වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ ......'' යන්න යි.
4. ''න අත්තහේතු න පරස්ස හේතු - න පුත්ත මිච්ඡේ න ධනං න රට්ඨං......'' යන්න යි.

31. චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව පුද්ගලයෙක් වර්ණවත් ව ඉපදීමට හේතු වනුයේ,
1. ද්වේශයෙන් තොරව කටයුතු කිරීම ය.
2. සත්ත්ව හිංසාව නොකිරීම ය.
3. අන් සැපතට ඊර්ෂ්‍යා නොකිරීම ය.
4. තමා සතු දේ අන් අයට දීම ය.

32. බුදුරජාණන් වහන්සේ කේසපුත්තයේ කාලාමවරුනට දේශනා කළ දහම තුළින් පිළිබිඹු වන්නේ,
1. කර්මඵල විශ්වාසය පිළිබඳව යි.
2. කුල භේදය බැහැර කිරීම පිළිබඳව යි.
3. සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳව යි.
4. මංගල කරුණු පිළිබඳව යි.

33. භාරතයේ තෙවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ,
1. පැළලුප් නුවර අශෝකාරාමයේ දී ය.
2. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ දී ය.
3. විශාලා මහනුවර වාළුකාරාමයේ දී ය.
4. රජගහනුවර සප්තපර්ණී ගල්ගුහා ද්වාරයේ දී ය.

34. අප රටට බුදු දහම වැඩම කරවීමෙන් පසු මෙරට ඉදි වූ ප්‍රථම ස්තූපය වන **ථූපාරාම දාගැබෙහි** තැන්පත් කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,
1. දකුණු දළදා වහන්සේ ය
2. ග්‍රීවා ධාතූන් වහන්සේ ය.
3. ලළාට ධාතූන් වහන්සේ ය.
4. දකුණු අකු ධාතූන් වහන්සේ ය.

35. අනුලෝම පටිච්ච සමුප්පාද විග්‍රහයට අනුව වේදනාව හේතු කොටගෙන ඇතිවන සසර දුක වන්නේ,
1. තණ්හාව යි.
2. උපාදානය යි.
3. සළායතනය යි.
4. විඤ්ඤාණය යි.

36. දකුණු අත උඩට නමා දබරැඟිල්ල මහපට ඇඟිල්ලේ තුඩ මත තබා කවයක් ලෙස ඇඟිලි දෙක සකස් කර නිර්මාණය කළ මුද්‍රාව හැඳින්වෙන්නේ,
1. ධ්‍යාන මුද්‍රාව ලෙස ය.
2. අභය මුද්‍රාව ලෙස ය.
3. විතර්ක මුද්‍රාව ලෙස ය.
4. ධර්මචක්‍ර මුද්‍රාව ලෙස ය.

37. **''ආහාරේ මත්තඤ්ඤුතා''**හෙවත් ආහාරයෙහි පමණ දැන අනුභව කිරීමේ, යහපත් ප්‍රතිඵල දක්වා ඇත්තේ,
1. පරාභව සූත්‍රයේ ය.
2. භද්දාලිය සූත්‍රයේ ය.
3. වේළුද්වාර සූත්‍රයේ ය.
4. කාලාම සූත්‍රයේ ය.

38. පාළි භාෂාවේ "අඩ්ඪචන්දපාෂාණ "යනුවෙන් හැඳින්වෙන කලාත්මක නිර්මාණය වන්නේ,
1. වාහල්කඩ යි.
2. කොරවක්ගල යි.
3. සඳකඩ පහණ යි.
4. මුරගල යි.

39. ධාර්මික ව උපයාගත් ධනයක් තමන්ට ඇතැ යි සිතා යම් කෙනෙක් ලබන සතුට
1. අනවජ්ජ සුඛය යි.
2. භෝග සුඛය යි.
3. අනණ සුඛය යි.
4. අත්ථි සුඛය යි.

40. **සද්ධර්මාලංකාරය** නැමැති සාහිත්‍ය කෘතිය රචනා කළේ
1. දඹදෙණි සාහිත්‍ය යුගයේ දී ය.
2. ගම්පොළ සාහිත්‍ය යුගයේ දී ය.
3. කුරුණෑගල සාහිත්‍ය යුගයේ දී ය.
4. කෝට්ටේ සාහිත්‍ය යුගයේදී ය.

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ඒකකය